www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් -- 9 වන කොටස

**The Historical and International Foundations of the Socialist Equality Party—Part 9**

*එක්සත් ජනදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් ලියවිල්ල කොටස් වසයෙන් පල කිරීම අපි ආරම්භ කර ඇත්තෙමු. පසුගිය අගෝස්තු 3-9 දිනවල පැවති සසප ආරම්භක සම්මේලනයේ දී මෙම ලියවිල්ල පුලුල් ලෙස සාකච්ඡා කරනු ලැබ ඒකමතිකව සම්මත කර ගන්නා ලදි. සම්මේලනයේ දී සම්මත කෙරුනු සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ද මීට පෙර ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල විය.*

## ලෝක තත්වයේ මාරුව, ධනේශ්වර ප්‍රති ප්‍රහාරය

171. 1968 සිට 1975 දක්වා කාලය අංගලක්ෂිත වූයේ කම්කරු පන්තියේ දැවැන්ත නැගිටීම් මගිනි. වාමාංශික හා සමාජවාදී ව්‍යාපාර ලෙව පුරා ම සැලකිය යුතු ප්‍රමානයකින් වැඩී ගියේය. 1972 ග්‍රීෂ්මයේ බ්‍රිතාන්‍ය කම්කරුවන්ගේ බලගතු වැඩ වර්ජන ව්‍යාපාරය මධ්‍යයේ, "පාලනය කරන්නේ කවුද" ? යන ශීර්ෂය යටතේ ඩේලි ටෙලිග්‍රාෆ් පත්‍රය කතුවැකියක් පලකලා ය. ඒ තුල, කම්කරුවන් විසින් ධනේශ්වර රාජ්‍යය පෙරලා දැමීමේ අනතුර ගැන විවෘතව සඳහන් කරනු ලැබිනි. එක්සත් ජනපදයේ දී ඒඑෆ්එල්-සීඅයිඕ නිලධරයේ සහයෝගය ද ඇතිව, නික්සන් පරිපාලනය විසින් වැටුප් කැටිකිරීමට ගත් උත්සාහය, එන්ට එන්ටම සටන්කාමී වූ කම්කරු පන්තියේ විරෝධය හමුවේ අසාර්ථක විය. රටක් රටක් පාසා කම්කරුවන් සිය පන්ති අවශ්‍යතාවන් රැක ගැනීම සඳහා සටන් වැදීමේ අදිටන පෙන්නුම් කලේ ය. එහෙත් 1938 දී ට්‍රොට්ස්කි හඳුනාගත් මූලික ඓතිහාසික ගැටලුව වූ "කම්කරු පන්තියේ නායකත්වය පිලිබඳ ඓතිහාසික අර්බුදය" නොවිසඳී ඉතිරිව තිබුනි. පැරනි ස්ටැලින්වාදී හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු හා වෘත්තීය සමිති නිලධරය, පැබ්ලෝවාදී ප්‍රවනතාවන්ගේ තීරනාත්මක සහාය ද ඇතිව සිය තත්වයේ බල මහිමය යොදාගත්තේ, ධනේශ්වර පාලනයට තර්ජනයක් වූ මහජන අරගල පීලි පන්නා, අවමංගතකර, මැඩීම සඳහා ය. දැවැන්ත විප්ලවකාරී ගම්‍යයක් සහිත තත්වයන්, පරාජයට ඇද දමමින් අවමංගතකර, ව්‍යාකූලකර, පාවාදෙනු ලැබිනි. ස්ටැලින්වාදීන්ගේ ද, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ද ද්‍රෝහිත්වය සිය බිහිසුනුම ප්‍රකාශනය අත් කර ගත්තේ චිලියේදී ය. එහි දී කොමියුනිස්ට් පක්ෂය විසින් මුක්කුව දුන් ඇලන්ඩේගේ "සමාජවාදී" ආන්ඩුව තමන්ට හැකි සියල්ල කරමින් කම්කරු පන්තිය බලය අල්ලා ගැනීමෙන් වැලැක්වී ය. ධනේශ්වර රාජ්‍යය පෙරලා දැමීම වැලැක්වීමේ ලා ඔහුගේ උත්සාහයන්හි ප්‍රතිවිපාකයක් ලෙස ඇලන්ඩේට තමාගේ ම ජීවිතය ද අහිමි විය. 1973 සැප්තැම්බර් 11 වන දින ජෙනරාල් ඔගස්ටෝ පිනෝෂේ විසින් මෙහෙයවූ මිලිටරි කුමන්ත්‍රනයට කොන්දේසි සැකසීමේ දේශපාලන වගකීම එමගින් පහව යන්නේ නැත.

172. තමන්ගේ ම සංවිධාන විසින් නිර්මානය කර තිබූ දේශපාලන තාප්පය බිඳගෙන යාමට කම්කරු පන්තිය අසමත්වීම මගින්, බිඳීගිය ලෝක පර්යාය පිලිසකර කර ස්ථාවර කර ගැනීමට ධනේශ්වරයට අවශ්‍යව තිබූ කාලය ලබාදුන්නේය. 1975 මැද භාගය වන විට ආර්ථික අර්බුදයේ ඔද්දල් ස්වභාවය පහව යන ලකුනු ක්‍රමයෙන් පහලවෙමින් තිබුනි. තෙල් මිල සිවු ගුනයකින් ඉහල නැගීමෙන් පසුව මැද පෙරදිගට ගලා ගිය ඩොලර්, (පෙට්රෝ ඩොලර්) ලෝක මූල්‍ය පද්ධතිය සඳහා නව ද්‍රවශීලතාවය සම්පාදනය කිරීමට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රතිචක්‍රීයකරනය කලේ ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අනුග්‍රහයෙන් සිදු වූ "ඔසවාතැබීම" මගින්, බ්‍රිතාන්‍යයේ ලේබර් පක්ෂ අගමැති හැරල්ඩ් විල්සන්ට, කම්කරු පන්තිය මත නව ප්‍රහාර සඳහා පදනම දමන අතරතුර, වෘත්තිය සමිති නිලධරය සමඟ තාවකාලික සම්මුතියක් ගසාගැනීමට අවශ්‍ය මූල්‍ය නය පහසුකම් සැලසුනි. ලේබර් ආන්ඩුවේ ප්‍රතිගාමී දේශපාලන අරමුනුවල වඩාත්ම දැනුවත් ප්‍රකාශනය අත් කර ගත්තේ 1975 සැප්තැම්බරයේ දී කම්කරු විප්ලවවාදී පක්ෂයේ අධ්‍යාපන මධ්‍යස්ථානය වෙත පෙර නොවූ විරූ පොලිස් ආක්‍රමනයක් සඳහා විල්සන්ගේ ආන්ඩුව විසින් නියෝග නිකුත් කිරීමත් සමඟ ය.

173. අර්බුදයට විප්ලවකාරී සමාජවාදී විසඳුමක් දීමට කම්කරු පන්තිය අසමත් වීම මගින් නිර්මානය කල සමාජ වික්ෂෝභය ගසාකෑම සඳහා 1975 අග භාගයේ දී ජාත්‍යන්තර ධනවාදීන්ට අවස්ථාව එලඹුනි. 1975 නොවැම්බරයේ ඕස්ට්‍රේලියාවේ දී, ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තෝරා පත් කර ගත් ගෞෆ් විට්ලම්ගේ ලේබර් ආන්ඩුව, ප්‍රකෝපකාරී ලෙස බලයෙන් පහකිරීමට ධනපති ලිබරල් පක්ෂය ගෙන ගිය වැඩ කටයුතුවලින්

නිර්මානය කල දේශපාලන අර්බුදය තුලට අග්‍රාන්ඩුකාර ජෝන් කර් මැදිහත් විය. මෙම ක්‍රියාව සිදුවූයේ, සීඅයිඒ සංවිධානය විට්ලම් ආන්ඩුව අස්ථාවර කිරීමේ කටයුතුවලට දැඩි ලෙස සම්බන්ධ බව හොඳින් දැනසිටි අවස්ථාවකය. කර් නොසලකා හරිමින් විට්ලම් කෙලින් සිටිය යුතු බව ඉල්ලමින් කම්කරු පන්තිය ගෙන ගිය දැවැන්ත විරෝධය කර්ගේ "කුමන්ත්‍රනය"ට හරස්විය. ඕස්ට්‍රේලියාව පුරා කම්කරු පන්තික විරෝධතාකරුවන් ලක්ෂ ගනනක් කර් "පන්නනු" යයි විට්ලම්ට බලකරමින් හඬ නැගුහ. ඒ වෙනුවට විට්ලම් බියගුලු ලෙස අග්‍රාන්ඩුකාර කර්ට යටත් වෙමින් අගමැතිකම හැර දැමීය. කම්කරු නිලධරය පෙන්නුම් කල එවන් දේශපාලන බියගුලුකම් ඉඩ සැලසුවේ, දඬුවම් නොලැබ ම කම්කරු පන්තියට පහර දිය හැකිය යන විශ්වාසය ජාත්‍යන්තර ධනේශ්වරය තුල දල්වාලීමට පමනි. ආර්ජන්ටිනාවේ දී, පැබ්ලෝවාදීන් පිටුබලය දුන් පෙරොන්වාදී තන්ත්‍රය මිලිටරි කුමන්ත්‍රනයකින් පෙරලා දැමීමත් සමග වාමාංශයට එරෙහි භීෂන සමයක් ඇරඹුනි. ශ්‍රී ලංකාවේ හා ඊස්රායලයේ දක්ෂිනාංශික ආන්ඩු බලයට සැමිනි අතර ඔවුන් ජීවන විටත් චිලී ආඥාදායකත්වය විසින් ක්‍රියාවට නගා තිබුනු මිල්ටන් ෆ්‍රීඩ්මාන්ගේ ආර්ථික න්‍යායන් ඇතුලු ඔහු විසින් පුම්බන ලද ප්‍රති කේන්සියානුවාදය වැලඳ ගත්තේය.

174. 1979 දී මාගරට් තැචර්ගේ නායකත්වයෙන් ටෝරි පක්ෂය බ්‍රිතාන්‍ය තුල බලයට පැමිනියේ ය. ඇගේ ජයග්‍රහනයට කොන්දේසි සකසනු ලැබුවේ ලේබර් ආන්ඩුවේ දක්ෂිනාංශික පිලිවෙත් වලිනි. ඊනියා " නොසංසුන්භාවයේ ශීත කාලය" ලෙස හැඳින්වූ වැඩ වර්ජන මාලාවක්, 1978 හා 1979 මුල දී පැන නැංගේය. මෙම සියලු අරගලයන් වෘත්තීය සමිති නිලධරය විසින් පාවාදෙනු ලැබිනි. 1977-78 කාලයේ පැන නැගුනු හා දින 100කට වැඩි කාලයක් දිගට ඇදුනු පතල් කම්කරු අරගලය මධ්‍යයේ එක්සත් ජනපදය තුල කාටර් පරිපාලනය තියුනු ලෙස දකුනට මාරුවිය. කම්කරුවන් ආපසු වැඩට දක්කන ටැෆ්ට්-හාර්ට්ලි පනත පිලිබඳ ආන්ඩුවේ යාදින්න කම්කරුවන් විසින් නොතකා හල අතර, බලගැන්වීමට නොහැකි විය. කම්කරු පන්තිය මත ප්‍රහාර එල්ල කිරීම සඳහා තවදුර සූදානම අවශ්‍ය බවට ඇමරිකානු පාලක පන්තිය තීරනය කලහ. 1979 අගෝස්තුවේ දී ජනාධිපති කාටර්, ෆෙඩරල් රිසර්ව් බැංකුවේ සභාපති ලෙස පෝල් වෝකර් පත්කලේය. වෝකර් පෙර නොවූ විරූ මට්ටම් කරා පොලී අනුපාතිකයන් නැංවීමට පටන් ගත්තේ, විරැකියාව සැලකිය යුතු මට්ටමකින් ඉහල නැංවීම, එමගින් කම්කරු පන්තිය දුබල කිරීම හා ප්‍රධාන දක්ෂිනාංශික ප්‍රහාරයක් සඳහා පසුබිම සකස් කිරීමට තුඩුදෙන අවපාතයක් කුලුගැන්වීමේ අරමුන ඇතිව ය. රොනල්ඩ් රේගන්ට රිපබ්ලිකන් පක්ෂයේ නාමයෝජනා හිමිවීමෙනුත්, 1980 නොවැම්බරයේ ඔහු ජනාධිපති ලෙස පත්කර ගැනීමෙනුත් සනාථ වූයේ පන්ති ගැටුම දෙසට තියුනු නැම්මකි. 1981 වැඩ භාරගැනීමෙන් සය මසකට මඳක් වැඩි කලකට පසුව අගෝස්තුවේ දී ගුවන් ගමන් පාලකවරුන්ගේ සංවිධානය (පැට්කෝ) කැඳවූ වැඩ වර්ජනයට රේගන් පරිපාලනය ප්‍රතිචාර දැක්වූයේ 11,000 ක් වැඩ වර්ජකයන් නෙරපාහරින බව නිවේදනය කරමිනි. මෙම දැවැන්ත ප්‍රහාරයට එරෙහිව කම්කරුවන් ආරක්ෂා කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීම ඒඑෆ්එල් - සීඅයිඕ නායකත්වය ප්‍රතික්ෂේප කලහ. මෙම සිද්ධිය සලකුනු කලේ එක්සත් ජනපදය තුල සැලකිය යුතු සමාජ බලවේගයක් ලෙස වෘත්තීය සමිති ව්‍යාපාරයේ අවසානය ආරම්භ වී ඇති බවයි. මෙය සංගතවලට විවෘත ලෙස වැඩ වර්ජන බිඳීම සඳහා ආන්ඩුව විසින් නිකුත්කල කොල එලියකි. තවද, ඒඑෆ්එල්-සීඅයිඕව, තමන් කම්කරු පන්තියට එරෙහි දක්ෂිනාංශික ගල්රෝල නතර කිරීමට කිසිවක් නොකරන බව පැහැදිලිව ප්‍රකාශයට පත්කර තිබුනි.

175. ධනවාදයේ ප්‍රධාන මධ්‍යස්ථාන තුල දී කම්කරු පන්තිය ලැබූ පරාජයන්, අධිරාජ්‍යවාදී අවශ්‍යතා වෙනුවෙන් වඩාත් ආක්‍රමනකාරී පිලිවෙතක් සඳහා මඟ හෙලිකිරීමක් විය. මල්විනාස් (ෆෝක්ලන්ඩ් දූපත්) වෙතින් ආර්ජන්ටිනාව දොට්ට දැමීම සඳහා අගමැති මාගරට් තැචර් දකුනු අත්ලාන්තික් සාගරය වෙත බ්‍රිතාන්‍ය නාවික හමුදාව පිටත්කර හැරියා ය. රේගන් පරිපාලනය, එල් සැල්වදෝරය හා නිකරගුවාහි වාමාංශික හමුදාවන්ට එරෙහිව කැත යුද්ධයක ද, ඇෆ්ගනිස්ථානයේ මුජාහෙඩීන්වරු සමග ගනුදෙනු වැඩි දියුනු කිරීම ද, ලෙබනනයට එක්සත් ජනපද හමුදා යැවීම ද, සිය සෝවියට් විරෝධී "දුෂ්ට අධිරාජ්‍යය" කයිවාරු හා ග්‍රෙනෙඩාවට හමුදා මැදිහත් කරවීම ද තුල පැටලුනි.

## කම්කරු විප්ලවවාදී පක්ෂය තුල අර්බුදය

176. කම්කරු විප්ලවවාදී පක්ෂයේ අපේක්ෂාවන්ට පටහැනි ලෙස, 1974 මාර්තු මස එංගලන්තය තුල කම්කරු පක්ෂය යලි බලයට පත්වීම, ඉක්මනින් ම කම්කරු පන්තිය හා නව ආන්ඩුව අතර ගැටුමකට තුඩුදුන්නේ නැත. ජාමූඅ පිටුබලය ලැබ "ඔසවා තබන" ලද ආර්ථිකය, ලේබර් ආන්ඩුවට උපාමාරු දැමීමේ ඉඩක් සම්පාදනය කලේ ය. මෙම නව තත්වය හෙලිකලේ කව්ප දේශපාලන අත්තිවාරමේ දුබලකම් ය. එස්එල්එල් කව්ප බවට පරිවර්තනය කිරීමත්, ඒ සමඟ අත්වැල් බැඳගත් "මහා බඳවාගැනීමේ" උද්ඝෝෂනත් ප්‍රධාන කොට ම පදනම් කරනු ලැබුවේ කම්කරු පන්තිය තුල පුලුල් ලෙස පැතිර තිබූ ප්‍රාථමික ටෝරි විරෝධී මනෝගතියට ආයාචනය කිරීම මතය. නව පක්ෂය හා එහි සාමාජිකත්වය, කම්කරුවාදීන් යලි බලයට පත්වීමෙන් නිර්මානය කල වඩාත් සංකීර්න තත්වය සමග ගනුදෙනු කිරීමට තරම් හොඳින් සන්නද්ධව නොසිටියහ.

177. කවිපය කම්කරු පන්තියේ දේශපාලන වර්ධනය තුල මුහුන පෑ දුෂ්කරතාවන් ජයගැනීමට උත්සාහ කලේ සහයෝගිතා පදනම වෙනත් තැනක සොයා ගැනීමෙනි. මැද පෙරදිග විවිධ ජාතික විමුක්ති ව්‍යාපාර හා ජාතිකවාදී ධනපති තන්ත්‍රයන් සමග දේශපාලන සම්බන්ධකම් වගාකිරීම 1976 දී ආරම්භ විය. ඉහල පරිමානයේ දේශපාලන අවමංගත වීමක් එමගින් ප්‍රකාශයට පත්විය. මාක්ස්වාදී ව්‍යාපාරය ගොඩනැඟීමේ දී එහි හරි මැද ඇත්තේ සංශෝධනවාදයට එරෙහි අරගලය බවට කව්ප මුලින් කල අවධාරනයෙන් එය ලුහුටා ගිය තාක් දුරට හීලි ද, ඔහුගේ සමීපතමයන් වූ ක්ලිෆ් ස්ලෝටර් හා මයිකල් බන්ඩා ද 1950 හා 1960 ගනන්වල ඔවුන්ම සටන් වැදුනාවූ පැබ්ලෝවාදී සංකල්ප කරා වඩ වඩාත් විවෘතව ඇදී ගියේය. පැබ්ලෝවාදී ක්‍රියාමාර්ගයට ඔවුන්ගේ යටත් වීම සමඟ අත්වැල් බැඳගෙන මාක්ස්වාදය පිලිබඳ විඥානවාදී ගුඪකරනයක් වර්ධනය කිරීම මගින් විශ්ලේෂනයේ අපෝහක භෞතිකවාදී විධික්‍රමයේ ස්වභාවය, වැදගත්කම හා භාවිතය අමු අමුවේ විකෘති කරන ලදී.

## කව්ප පිලිබඳ ව�කර්ස් ලීගයේ විවේචන

178. 1960 ගනන්වල හා 70 ගනන් මුල බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය ව'කර්ස් ලීගය මත දැඩි හා ආන්තිකව සාධනීය වූ බලපෑමක් කලේ ය. ව'කර්ස් ලීගය බිහිවීම හා එහි ආරම්භක වර්ධනය සෝශලිස්ට් ලේබර් ලීගයේ හා සියල්ලට මත් වඩා එහි ප්‍රධාන නායක ජෙරී හීලිගේ මිල කල නොහැකි අත්දැකීම් සමුදාය නොවන්නට සිදු නොවිය හැකිව තිබුනි. තව ද විශේෂයෙන් ම වූල්ෆර්ත් සමග භේදයෙන් පසුව ව'කර්ස් ලීගයේ වර්ධනය සිදුවූ ආකාරය කම්කරු විප්ලවවාදී පක්ෂයෙන් කැපී පෙනෙන පරිදි වෙනස් විය. ප්‍රධාන වෙනස සැදුම් ලත්තේ ව'කර්ස් ලීගය ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඉතිහාසය හා පැබ්ලෝවාදයට එරෙහි අරගලයේ පාඩම් කෙරෙහි යොමුකල අවධානයෙනි.

179. වූල්ෆර්ත් සමග භේදයෙන් පසු කාලයේ දී ව'කර්ස් ලීගය සිය වැඩ කටයුතු කම්කරු පන්තිය වෙත දිශානුගත කලේ ය. 1970 ගනන් මැද භාගයේ දී ලීගය, කම්කරු පන්තියේ බෙහෙවින් සටන්කාමී කොටස් තුල, සිය මැදිහත්වීම සැලකිය යුතු පරිදි ඉහල නැංවීය. ඉන් වඩාත් කැපී පෙනුනේ යූඑම්ඩබ්ඡ් ගල්අඟුරු පතල් කම්කරුවන් අතර මැදිහත්වීම ය. 1978 දී ව'කර්ස් ලීගය සිය දේශපාලන මධ්‍යස්ථානය ඩිට්‍රොයිට් වෙත ගෙනයාමට තීරනය කලේ ය. මෙහි අරමුන පක්ෂය හා කම්කරු පන්තියේ දෛනික ජීවිතය හා අරගලයන් අතර සමීප සම්බන්ධයක් පිහිටුවා ලීමය. ඉන් පසුව එලඹි වසරවල ව'කර්ස් ලීගය හා එහි බුලටින් පුවත් පත කම්කරු පන්තියේ ප්‍රධාන අරගලයන් වූ, ගුවන් ගමන් පාලකවරුන්, ෆෙල්ප්ස් ඩොජ් කුපර් පතල් කම්කරුවන්, ග්‍රේහවුන්ඩ් බස් රියැදුරන් හා හෝමෙල් කම්කරුවන්ගේ වැඩ වර්ජන තුල ද. බටහිර වර්ජිනියාවේ හා කෙන්ටුකීහි ගල්අඟුරු බිම්වල නොයෙකුත් වැඩ වර්ජන තුල ද මැදිහත් විය. මෙම සියලු අරගල දැකගනු ලැබුවේ, වෘත්තීය සමිති සටන්කාමීත්වයට සතුට පල කිරීමේ අවස්ථාවන් ලෙස නොව, කම්කරු පන්තිය තුල මාක්ස්වාදී නායකත්වයේ, සමාජවාදී විඥානයේ වර්ධනය සඳහා අත්‍යාවශ්‍ය දේශපාලන අරගලයන් ලෙස ය. මෙම වැඩ කටයුතු මගින් ව'කර්ස් ලීගයට පරිපූර්න ජාත්‍යන්තර විප්ලවවාදී මූලෝපායක් වර්ධනය කිරීම සඳහා දැනටමත් තමන් අතගසා සිටි කර්තව්‍යය පිලිබඳ මනා වැටහීමක් ලබා දුන්නේය.

180. ව'කර්ස් ලීගය හා කව්ප අතර නොඑකඟතාවන් 1982 දී විවෘතව එලිමහනට පැමිනියේ ය. ටොම් හෙනහන් ඝාතනයේ පස්වන අනුස්මරනය වෙනුවෙන් ව'කර්ස් ලීගයේ ජාතික ලේකම් ඩේවිඩ් නෝර්ත් පලකල රචනයක් තුල මාක්ස්වාදී ව්‍යාපාරයේ කේඩරය අධ්‍යාපන ගත කර ගැනීමේ දී ඉතිහාසයේ වැදගත්කම අවධාරනය කලේ ය. ඔහු මෙසේ ලිවීයෑ

> කේඩර් පුහුනුවේ සැබෑ හදවත වන්නේ පක්ෂයට එකතුවන සියලුම දෙනා මාක්ස්වාදයේ අඛන්ඩතාවය ප්‍රකාශිත කරන්නා වූ විප්ලවවාදී මූලධර්මවලට දැනුවත්ව යටත් කිරීම ය. "ඓතිහාසික අඛන්ඩතාවය" යනුවෙන් අප වටහා ගන්නේ අපගේ ජාත්‍යන්තර ව්‍යාපාරය විසින් ස්ටැලින්වාදයට සමාජ ප්‍රජාතන්ත්‍රවාදයට, සංශෝධනවාදයට සහ කම්කරු පන්තියේ අන් සකල විධ සතුරන්ට එරෙහිව ගෙනයන ලද දේශපාලන සහ දෘෂ්ටිමය අරගලයේ නො බිඳුනු දම්වැලයි....
>
> හැම ජාතියකම සංශෝධනවාදියෝ ද දේශපාලන හොර වෙද්දු ද තම පිලිවෙත් සහ දේශපාලනය දෙන ලද හෝරාවේ ක්ෂනික හා ප්‍රායෝගික අවශ්‍යතාවය මත අනිවාර්යයෙන් ම පදනම් කර ගනිති. මූලධර්මික කාරනා, එනම් ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ ඉතිහාසය පිලිබඳ බරපතල අධ්‍යයනයකින්, නියාම පාලිත සන්තතියක් ලෙස එහි වර්ධනය හැදෑරීමෙන්, ලත් ඥානය ද ඉන් ගලා එන පරිදි එහි (එම ව්‍යාපාරයේ) වෛෂයික අත්දැකීම් නිරන්තරව විවේචනාත්මකව පුනර්කරනය කිරීම ද තත්කාර්යවාදීන්ට මුලුමනින්ම අරහං ය....
>
> මෙම ඉතිහාසයේ සමස්තය උකහා ගැනීමට සාමූහිකව යත්න නොදරන නායකත්වයක් කම්කරු පන්තිය කෙරේ තම ඓතිහාසික වගකීම් ඉටුකරලීමට නො

පොහොසත් ය. ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඓතිහාසික වර්ධනය පිලිබඳ සැබෑ ඥානයකින් තොරව, අපෝහක භෞතිකවාදය ගැන කරන සඳහන් කිරීම් හිස් ඒවා වනවා පමනක් නොවේ; එවන් හිස් සැඳහුම් අපෝහක භෞතික විධික්‍රමය පිලිබඳ සැබෑ විකෘතියක් ද වන්නේ ය. න්‍යායේ උල්පත පවතින්නේ චින්තනය තුල නොවේ; වෛෂයික ලෝකය තුලය. මේ අනුව ට්‍රොට්ස්කිවාදයේ වර්ධනය ගමන් කරන්නේ, අපගේ ව්‍යාපාරයේ ඓතිහාසිකව උකහාගත් සමස්ත ඥානය මත පන්ති අරගලයේ නව අත්දැකීම් ප්‍රතිෂ්ඨාපනය කිරීමෙනි. [104]

181. "අපෝහක භෞතිකවාදය පිලිබඳ අධ්‍යයනය" නමින් හීලි විසින් රචිත පොත් පිංච පිලිබඳ සම්පූර්න විවේචනයක් නෝර්ත් කම්කරු විප්ලවවාදී පක්ෂයට ඉදිරිපත් කලේය. මෙම විවේචනය, හීලිගේ අපෝහකය පිලිබඳ සංකල්පය, ද්‍රව්‍යවාදය පිලිකෙව් කිරීමක් හා 1840 ගනන්වල මුල, වාම හෙගලියානුවන් පිලිබඳව මාක්ස් සිය විවේචනය තුලින් සමතික්‍රමනය කල ආත්මීය විඥානවාදී දර්ශනවාදයේ ස්වරූපය කරා පල්ලම් බැසීමක් බව පෙන්වා දුන්නේය. නෝර්ත් මෙසේ ලිවීය:

> හීලි සහෝදරයාගේ "අපෝහක භෞතිකවාදී අධ්‍යයනය" එක් තීරනාත්මක හීනතාවයකින් පෙලෙයි. ඒවා මාක්ස් හා ලෙනින් යන දෙදෙනාම හෙගලියානු අපෝහකය පිලිබඳව යලි හැදෑරීමෙන් ලබාගත් ජයග්‍රහන අවශ්‍යයෙන්ම නොතකා හැර තිබේ. එබැවින් හේගල් කරා පිවිසෙන්නේ, මාක්ස් සටන් වැදි වාම හෙගලියානුවන්ගේ එම ආකාරයේ ම අවිවේචනාත්මක ප්‍රවිෂ්ටයක් සමඟින්ය. ... □
>
> පසෙකට දැමූ හෙගලියානු අපෝහකයේ ආකෘතිය ඒ ආකාරයෙන් ම යොදාගත නොහැකි යයි බොහෝවිට මාක්ස් හා එංගල්ස් යන දෙදෙනාම කල අනතුරු ඇඟවීම හීලි සහෝදරයා විසින් සැලකිල්ලට නොගනියි. එබැවින් ඔහු සංජානනයේ ක්‍රියාවලිය පැහැදිලි කිරීමට උත්සාහ කරන්නේ කෙලින්ම හෙගලියානු තර්ක ක්‍රමයෙනි. මෙය සදොස් ප්‍රවිෂ්ටයකි. චින්තන ක්‍රියාවලිය තර්කයෙන් පැහැදිලි කල නොහැකිය. රාජ්‍යයේ ස්වභාවය තර්කයෙන් පැහැදිලි කරනවාට නොවැඩි ආකාරයකිනි. ...□
>
> "හේගල් දෙපයින් සිටුවීම" යන වැකිය මෙම කර්තව්‍යයෙහි ගැබ්ව ඇති ප්‍රගාඪ විද්‍යාත්මක ජයග්‍රහනය දියකර හැරීමට යොදා නොගත යුතුය. ද්‍රව්‍යවාදී විද්‍යාත්මක ලෝක දෘෂ්ටියක්, ස්වභාවධර්මයේ, සමාජයේ හා විඥානයේ නීති සංජානනය කිරීම මඟින් පිහිටුවාලීමට නොඅඩු දෙයක්, මෙයට බැඳී නැත. තවදුරටත් දර්ශනවාදයේ මූලික උත්සුකය "තර්කය පිලිබඳ ද්‍රව්‍යය" නොව "ද්‍රව්‍යය පිලිබඳ තර්කයයි."□
>
> හෙගලියානු තාර්කික සැලැස්ම එපරිද්දෙන් ම යොදාගත් විට, තාර්කික ප්‍රවර්ග සංචාලනය හා පූර්වයෙන් පැවති ප්‍රවර්ගවලට ගැලපීම සඳහා අනුභූතික සාධක තවදුරටත් සංචාලනය කිරීම හරහා නොවැලැක්විය හැකි පරිදි මෙහෙය වෙන්නේ පන්ඩිතමානය කරාය. [105]□

182. සිය සමාප්තියේ දී නෝර්ත්, කව්ප නායකත්වය යටතේ හජාජාකහි දේශපාලන පරිනාමය ගැන ඔහුගේ විවේචනය සාරාංශගත කරයි. ඔහු මෙසේ ලිවීය. "අපෝහකයේ අධ්‍යයනය, සැලකිය යුතු කාල පරිච්ඡේදයක් තිස්සේ ජාත්‍යන්තර කමිටුව තුල මෝදුවෙමින් පැවති අර්බුදය එලිමහනට ගෙනැවිත් තිබේ. වසර ගනනාවක් තිස්සේ (මාගේ අදහස අනුව 1976 ආරම්භ වූ මෙය 1978 වන විට ආධිපත්‍ය දැරීමට පටන් ගත්තා පමනි.) අපෝහක භෞතිකවාදය හා ප්‍රචාරකවාදයට එරෙහි අරගලයේ නාමයෙන් ජාත්‍යන්තර කමිටුව ට්‍රොට්ස්කිවාදය සඳහා අරගලයෙන් එක එල්ලේ ම ඉවතට ඇදී ගියේය. හීලිගේ න්‍යායික විධික්‍රමය පිලිබඳ විවේචනය, මැද පෙරදිග ජාතික ධනේශ්වර තන්ත්‍රයන් සමඟ කව්ප සම්බන්ධකම් පිලිබඳ විශ්ලේෂනයක් සමඟ බැඳී තිබුනි. මාක්ස්වාදයේ ග්‍රාම්‍යකරනයක්, 'අපෝහකවාදය සඳහා අරගලය' ලෙස තල්ලුකර හැරීම, ජාත්‍යන්තර කමිටුව තුල, විශේෂයෙන් ම කව්ප තුල නොවරදින අවස්ථාවාදී මැරුවක් සමඟ අත්වැල් බැඳගත්තේ ය. ජාතික විමුක්ති ව්‍යාපාර ආරක්ෂා කිරීමේ මාක්ස්වාදී පිලිවෙත හා අධිරාජ්‍යවාදයට එරෙහි අරගලය අර්ථ දැක්වූයේ, විවිධ ජාතික ධනපති තන්ත්‍රයන්ට අවිවේචනාත්මක සහයෝගය පිදීමේ අවස්ථාවාදී රටාවකට ය." [106]□

183. 1984 ජනවාරි-පෙබරවාරි කාලයේ ව'කර්ස් ලීගය, කව්ප පරිහානිය පිලිබඳව වඩාත් පරිපූර්න විශ්ලේෂනයක් ඉදිරිපත් කලේය. 1984 ජනවාරි 23 දාතමින් යුතුව කව්ප ප්‍රධාන ලේකම් මයිකල් බන්ඩා වෙත යැවූ ලිපියකින් නෝර්ත් ප්‍රකාශ කලේ, අප පැබ්ලෝවාදය ලෙස අනන්‍ය කරගෙන ඇති, නිගමනයන් හා ක්‍රමවේදයන් අතින් හරියට ම සමාන වන්නාවූ දේශපාලන ආස්ථානයන්, හිස එසවීමේ සලකුනු මඟින් ව'කර්ස් ලීගය, ගැඹුරු

ලෙස කනස්සල්ලට පත්ව සිටින බවයි. ජාත්‍යන්තර කමිටුව ගැන පහත සඳහන් කරුනු ඔහු පෙන්වා දුන්නේය.

> එය, සැලකියුතු කාලයක් තිස්සේ තම භාවිතයට මඟ පෙන්වන, පැහැදිලි හා දේශපාලනිකව ඒකාග්‍රවූ ඉදිරිදර්ශනයකින් තොරව වැඩ කරමින් සිටියි. සෑම රටකම ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවන් ගොඩනැඟීමේ ඉදිරිදර්ශනයකට වඩා, වසර ගනනාවක් තිස්සේ ජාක මූලික අවධානය යොමුව ඇත්තේ විවිධ ජාතික ධනපති තන්ත්‍රයන් හා විමුක්ති ව්‍යාපාර සමඟ සන්ධානයන් ගොඩනඟාගැනීම කෙරෙහිය. මෙම සන්ධනයන්ගේ අන්තර්ගතය, අර්ධ යටත්විජිත රටවල අධිරාජ්‍ය විරෝධී අරගලයන් තුල නිර්ධන පන්තියේ ප්‍රමුඛ කාර්ය භාරය ස්ථාපිත කිරීමේ සටනේ දී, අපගේ ම බලවේගයන් පොහොසත් කිරීම දෙසට කිසිදු පැහැදිලි යොමුවක් පිලිබිඹු නොකරන තරම්ය. 1960 ගනන් මුල අප එතරම් ම දැඩි ලෙස පහරදුන්, කියුබාව හා ඇල්ජීරියාව සම්බන්ධයෙන් එස්ඩබ්ලිව්පීය ඉදිරිපත් කල එම සංකල්පයන්ම අපගේ පුවත් පතෙහි වැඩිවන වාර ගනනින් පලවේ. [107]. .

184. 1984 පෙබරවාරි 11 වන දින හජාජාක වෙත යොමුකල වාර්තාවකින්, වර්කර්ස් ලීගයේ විවේචන නෝර්ත් විසින් විස්ථාරනය කලේය. එය, කව්පය ධනපති ජාතිකවාදයට අනුගතවීමේ කාරනය, පැබ්ලෝවාදයට එරෙහි ජාක දශක ගනනාවක් ගෙන ගිය අරගලයේ සංදර්භය තුල පිහිටුවාලූ අතර, බ්‍රිතාන්‍ය තුල සංශෝධනවාදී ප්‍රවනතාවන් සමඟ පක්ෂයේ අවස්ථාවාදී සම්බන්ධකම් ද පෙන්වා දුන්නේය. ඔහු මෙසේ පැහැදිලි කලේය.

> ජාත්‍යන්තර කමිටුව පදනම් වූයේ, මාක්ස්වාදීන්ගේ පූර්ව පරම්පරාවන් සියල්ලගේ ම දේශපාලන, න්‍යායික හා සංවිධානාත්මක අරගල තුලින් පිහිටුවාලූ සම්ප්‍රදායන් හා මූලධර්ම මතය. එම පූර්ව පරම්පරාවන් සමඟ ජාක මෙම අඛන්ඩතාවය ගොඩනඟා ඇත්තේ, කම්කරු ව්‍යාපාරය තුල. විශේෂයෙන්ම ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය තුලම මතුවූ විවිධ වර්ගයේ ප්‍රතිමාක්ස්වාදයට එරෙහි අරගලයක් තුලිනි. [108]

185. 1982 වසරේදී බාන්ස් විසින් ප්‍රකාශයට පත්කල, නොනවතින විප්ලවයේ න්‍යාය මුලුමනින්ම අතහැර දැමීමේ එක්සත් ජනපද එස්ඩබ්ලිව්පීයේ ආස්ථානය, හජාජාක විසින් පැබ්ලෝවාදී සංශෝධනවාදයට එරෙහිව ගෙන ගිය අරගලය සනාථ කරන බව නෝර්ත් පෙන්වා දුන්නේ ය. කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය සඳහා අරගලයට ආදේශකයක් ලෙස එස්ඩබ්ලිව්පීය හුවාදැක්වූයේ, ග්‍රෙනඩාවේ නිව්ජුවෙල් ව්‍යාපාරය, නිකරගුවාවේ සැන්ඩිනිස්ටාවරු හා එල් සැල්වඩෝරයේ ෆැරබුන්ඩෝ මාටි වැනි ව්‍යාපාරයන්ය. මෙම සන්දර්භය තුල, හජාජාක දේශපාලන අත්දැකීම් විභාග කල යුතු බව නෝර්ත් අවධාරනය කලේය. මැද පෙරදිග ජාතික ව්‍යාපාරයන් සමඟ එහි සම්බන්ධතා ගැන සඳහන් කරමින් ඔහු මෙසේ ප්‍රකාශ කලේය.

> 1978 මැද භාගය වන විට, ජාතික තන්ත්‍රයන් හා විමුක්ති ව්‍යාපාර දෙසට වූ පොදු දිශානතිය වැඩීගියේ කම්කරු පන්තිය තුල සැබවින්ම අපගේ බලවේගයන් ගොඩනැඟීමේ කිසිදු අනුරූපී ඉදිරිදර්ශනයකින් තොරව ය. සිය කේඩරයන්ට හා කම්කරු පන්තියට, මෙම ධනේශ්වර ජාතිකවාදීන් "අධිරාජ්‍ය විරෝධී නායකයන්" ලෙස හඳුනාගන්නා ලෙසට කැඳවුම් කරමින් හා ඔවුන්ට දේශපාලන සහාය දැක්විය යුතු බව කියා සිටින මුලුමනින්ම අවිවේචනාත්මක හා සාවද්‍ය හුවාදැක්වීම් අපගේ පුවත්පත් තුල වඩාත් විවෘතව දිස්වීමට පටන් ගෙන තිබේ. [109]

186. 1979 දී සාමාජිකයන් 21 දෙනෙකුගේ ඝාතනයත් ඇතුලත්ව, ඉරාක කොමියුනිස්ට් පක්ෂය මැඩීමට සදාම් හුසේන් ගත් පියවර සඳහා කව්පයේ සහයෝගය, 1979 පෙබරවාරි විප්ලවය පිලිබඳව මුලින් කල නිවැරදි අගැයීමෙන් පසුව, ඉරානයේ අයතොල්ලා කොමෙයිනි තන්ත්‍රය උත්කර්ෂයට නැංවීම, 1977- 1983 කාලයේ ලිබියන් ජමාහිරියාවේ නායක මුවම්මර් අල් ගඩාෆිට දුන් අවිවේචනාත්මක සහයෝගය, විශේෂයෙන් ම නෝර්ත්ගේ විවේචනයට ලක් විය. කව්පය ලේබර් පක්ෂය සමඟ ගොඩනඟාගෙන ඇති සම්බන්ධය ගැන ද නෝර්ත් සඳහන් කලේය. ඒ සම්බන්ධයට, මහා ලංඩන් කවුන්සිලය ද, කෙන් ලිවින්ස්ටන් හා ටෙඩ් නයිට් ද ඇතුලත් විය.

187. මෙම මතභේද පිලිබඳ සාකච්ඡාවකට එලඹීම කම්කරු විප්ලවවාදී පක්ෂය ප්‍රතික්ෂේප කලේ ය. ඒ වෙනුවට ඔවුහු, ව'කර්ස් ලීගය සිය විවේචන නතර නොකලහොත්, එය සමඟ සියලු සබඳකම් අත්හිටුවන බවට තර්ජනය කලහ. මෙම මූලධර්ම විරහිත හා අවස්ථාවාදී පිලිවෙත කව්පය සම්බන්ධයෙන් අවසනදී විනාශකාරී ප්‍රතිවිපාක ගෙනආවේ ය. වසරකට මඳක් වැඩි කාලයක් තුල, 1985 ශරත් කාලයේ සංවිධානාත්මක අර්බුදයකින් කව්පය බිඳ වැටුනේ ය. එය, හතරවන ජාත්‍යන්තරය හා ජාත්‍යන්තර කමිටුව ගොඩනැඟීමේ දී පදනම් කර

ගත් මූලධර්මයන්ගෙන්, දශකයකට වැඩි කාලයක් තිස්සේ දේශපාලනිකව (හ.ජා.ා.ජ.ක) පසුබැසීමේ ප්‍රතිපලයයි. හජාජාක දේශපාලන උපදෙස් පිලිගැනීම ප්‍රතික්ෂේප කිරීමත්, මුලුමනින්ම ජාතිකවාදී කොන්දේසි තුල පිලිසිඳගත් දේශපාලන උවමනාකම් අනුගමනය කිරීමේ කව්ප පිලිවෙතත් 1986 පෙබරවාරියේ භේදයකට තුඩුදුන්නේ ය. □

## කව්ප බිඳවැටීම හා ජාත්‍යන්තර කමිටුව තුල භේදය

188. 1985 අගෝස්තුවේ ජාත්‍යන්තර කමිටු (ජා.ක.) සාමාජිකයන් ලංඩන් නගරයට කැඳවනු ලැබූ අතර එහි දී, හීලි හා කව්පයේ අනෙකුත් නායකයන් ඔවුන්ට දැනුම් දුන්නේ, බ්‍රිතාන්‍ය ශාඛාව බරපතල මූල්‍ය ගැටලුවලට මුහුන දී සිටින බවයි. ජා.ක. සාමාජිකයන්ට දැනුම් දුන්නේ අනපේක්ෂිත බදු බරක් පැටවීමත්, කව්පයේ නිව්ස් ලයින් දිනපතා පුවත්පත බෙදාහැරීමේ වියදම් සැලකිය යුතු මට්ටමකින් ඉහල යාමත් ගැටලුවලට හේතු වූ බවයි. කව්ප නායකයෝ, ජා.ක. ශාඛාවන්ගෙන් හදිසි මූල්‍යාධාර ඉල්ලා සිටියහ. ජා.ක. දෙනලද වාර්තාව මුලුමනින්ම පාහේ බොරු බව ඉක්මනින්ම හෙලිදරව් විය. තවද, හීලිගේ ම අවිධිමත් පුද්ගල චර්යාව පිලිබඳ චෝදනා මත, බ්‍රිතාන්‍ය ශාඛාවේ නායකත්වය තුල හටගෙන තිබූ අර්බුදය පිලිබඳව කව්පය ජා.ක. සාමාජිකයන්ට දැනුම් දුන්නේ ද නැත. මෙම චෝදනා විභාග කිරීමට පරිපාලන කොමිසමක් පත්කල යුතුයයි මධ්‍යම කාරක සභාව තුලින් මතුවූ ඉල්ලීම්වලට හීලි පමනක් නොව මයිකල් බන්ඩා හා ක්ලිෆ් ස්ලෝටර් ද විරුද්ධවී තිබුනි. බ්‍රිතාන්‍ය ශාඛාව තුල අභ්‍යන්තර දේශපාලන අර්බුදයෙන් නිර්මානය කල ගැටලු වසාගැනීමට හජාජාකවෙන් මුදල් බලාපොරොත්තුවන අතර ම කව්ප, මෙම කරුනු ජාක සාමාජිකයන්ගෙන් වසං කිරීමට උත්සාහ කලේය. කෙසේ වුව ද ඊලග සති කීපය තුල කව්පයේ කන්ඩායමික කාකොටාගැනීම් උත්සන්නවෙද්දී, අර්බුයේ සුල මුල ජාක දැනගැනීමට ලැබුනි. ව'කර්ස් ලීගය නියෝජනය කරමින් ඩේවිඩ් නෝර්ත් ද, ඕස්ට්‍රේලියාවේ සෝශලිස්ට් ලේබර් ලීගයේ නික් බීම්ස් ද, ජර්මනියේ බුන්ඩ් සෝශලිස්ටිෂර් ආර්බයිටර් හි පීටර් ෂ්වාස්ට් හා උලී රිපට් ද, ශ්‍රී ලංකාවේ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයෙන් කීර්ති බාලසූරිය ද, කම්කරු විප්ලවවාදී පක්ෂයේ දේශපාලන තත්වය විමසා බැලීමට බ්‍රිතාන්‍යට ගමන් ගත්හ. බ්‍රිතාන්‍ය ශාඛාව තුල වර්ධනය වූ අර්බුදය මුල්බැස තිබුනේ, ජාත්‍යන්තර ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනයට සම්බන්ධ දිග් ගැස්සුනු දේශපාලන ප්‍රශ්න තුල බව ඔවුහු අවධාරනය කලහ. කව්ප නායකත්වය තුල මූලධර්ම විරහිත විවිධ කන්ඩායම් අතර හටගෙන තිබෙන අරගලයේ කිසිදු පැත්තක් තමන් නොගන්නා බව හජාජාක, බ්‍රිතාන්‍ය ශාඛාවේ නායකයන්ට දැනුම් දුන්නේය. කව්ප නායකයන් ජාත්‍යන්තර ව්‍යාපාරය, ඔවුන්ගේ ම ජාතිකවාදී හා අවස්ථාවාදී උවමනාකම් සඳහා ගසාකෑමට දරන උත්සාහය ජාක තරයේම ප්‍රතික්ෂේප කලේ ය. නිසැකව ම, කව්පයට සිය අර්බුදයෙන් දේශපාලනිකව ගොඩ ආ හැක්කේ බ්‍රිතාන්‍ය සංවිධානය, ජාත්‍යන්තර ව්‍යාපාරයේ අධිකාරය හා විනය පිලිපදින තාක් දුරට පමනක් විය. □

189. හීලිට එරෙහි චෝදනාවල සාධකමය පදනම පරීක්ෂා කිරීමෙන් පසුව, 1985 ඔක්තෝබ්ර 25 වන දින ජාත්‍යන්තර කමිටුව ඔහුගේ නෙරපාහැරීමට පක්ෂව ඡන්දය දුන්හ. ජාක නිකුත් කල ප්‍රකාශයේ මෙසේ සඳහන් විය:□

> හීලි නෙරපීමේ දී ජාක ට, ඔහු අතීතයේ දී කල දේශපාලන ප්‍රතිපදානයන් විශේෂයෙන් ම, 1950 හා 1960 ගනන්වල, හෙලාදැකීමේ කිසිදු බලාපොරොත්තුවක් නැත.
>
> සත්තකින්ම මෙම නෙරපාහැරීම, එම අතීත අරගල පදනම්ව තිබූ ට්‍රොට්ස්කිවාදී මූලධර්ම ප්‍රතික්ෂේප කිරීමේත්, අවස්ථාවාදයේ අතිශය ග්‍රාම්‍ය රූපාකාරයන් කරා ඔහුගේ පල්ලම් බැසීමේත් අවසන් ඵලය විය.
>
> හීලිගේ දේශපාලන හා පුද්ගල පරිහානිය, බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ප්‍රායෝගික හා සංවිධානාත්මක ජයග්‍රහන අත් කර ගනු ලැබූ, ස්ටැලින්වාදයට හා සංශෝධනවාදයට එරෙහිව ඓතිහාසිකවත් ජාත්‍යන්තරවත් පදනම් කල අරගලයෙන් කවරදාකටත් වඩා දැඩි ලෙස බෙදා වෙන්කල ඔහුගේ පිලිවෙතට, පැහැදිලි ලෙස ම බද්ධ කල හැකිය.
>
> ක්ෂනික ප්‍රයෝගික අවශ්‍යතාවන්ට, මූලධර්ම පිලිබඳ ප්‍රශ්න වඩ වඩාත් යටත් කිරීම මාධ්‍යගත වූයේ, ලොව පැරනි ම ධනේශ්වර රාජ්‍යය තුල අධිරාජ්‍යවාදී පීඩනයට එරෙහිව ඔහුගේ ම දේශපාලන හා සදාචාරාත්මක ඵ කවරනය, එක එල්ලේ ම බාදනය කල දේශපාලන අවස්ථාවාදයක් කරා පිරිහී ගිය පක්ෂ සැකිල්ලේ වර්ධනය ඵකගැනීම තුලය.
>
> මෙම කොන්දේසි යටතේ ඔහුගේ බරපතල ආත්මීය දුබලකම්, එන්ට එන්ටම අනතුරුදායක දේශපාලන ක්‍රියා කලාපයක් ඉටු කලේ ය.
>
> කව්පය තුලත්, හජාජාක තුලත් වඩ වඩාත් හිතුවක්කාරීව කටයුතු කරමින් හීලි,

ලෝක පක්ෂයේ ජයග්‍රහන හතරවන ජාත්‍යන්තරයේ මාක්ස්වාදී මූලධර්මවලට හා එහි කේඩරයේ සාමුහික අරගලය වෙත පවරනවා වෙනුවට ඔහුගේ ම පුද්ගලික හැකියාවන් වෙත ආරෝපනය කර ගත්තේය.

සිය ප්‍රතිභා සම්පන්න විනිශ්චයන් පිලිබඳ ඔහුගේ ස්වයං උත්කර්ෂය, අනිවාර්යයෙන්ම තුඩුදුන්නේ භෞතිකවාදී අපෝහකයේ අමු ග්‍රාම්‍යකරනයකටත්, දැඩි ආත්මීය විඥ්ඥානවාදියෙකු හා තත්කාර්යවාදියෙකු බවට හීලිගේ පරිවර්තනයටත් ය. ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී කේඩර් ගොඩනැඟීමේ සංකීර්න ගැටලු පිලිබඳව අතීතයේ ඔහුට පැවති උනන්දුව වෙනුවට හීලිගේ භාවිතය, ධනේශ්වර ජාතිකවාදී නායකයන් සමඟ ද, බ්‍රිතාන්‍ය ලේබර් පක්ෂ හා වෘත්තීය සමිති ප්‍රතිසංස්කරනවාදීන් සමඟ ද ප්‍රතිපත්ති විරහිත සබඳතා ගොඩනැගීමේ භාවිතයක් බවට පත්විය.

ඔහුගේ පුද්ගලික ජීවන රටාව ඊට සමගාමී පරිහානියකට භාජනය විය.

තමන් වරෙක සටන්වැදි මූලධර්ම අත්හල හා සිය ජාතික ශාඛාවන් ගොඩනැඟීමේ දී හජාජාකට යටත්වීම ප්‍රතික්ෂේප කල හීලි වැනි තවත් අය ද, පන්ති සතුරාගේ පීඩනය හමුවේ පරිහානිගතවීම නොවැලැක්විය හැකිය.

මෙම ඓතිහාසික නීතියට කිසිදු විකල්පයක් ඇත්තේ නැත.

කිසිදු නායකයෙක් කම්කරු පන්තියේ ඓතිහාසික ආශක්තතාවන්ට ඉහලින් නොපිහිටන බව හජාජාක දැඩි ලෙස කියා සිටියි. [110] □

190. හීලි සමඟ වූ ඔවුන්ගේ කන්ඩායමික ගැටුමේ ආත්මීය කටුක භාවය කොතෙක් වුවත්, බන්ඩා හා ස්ලෝටර් ඔහුගේ අවස්ථාවාදී හා ජාතිකවාදී ඉදිරිදර්ශනය බෙදා හදා ගත්හ. හීලිට වඩා නොඅඩුව ඔවුන් ද දශක තුනකට වැඩි කාලයක් මූලික ක්‍රියාකලාපයක් ඉටුකල සංවිධානය මුහුන පෑ අර්බුදයේ සුල මුල හා වර්ධනය පිලිබඳ වෛෂයික පරීක්ෂනයක් මඟහැරීමට උත්සාහ කලහ. තව ද, ඉක්මනින් ම පැහැදිලි වූයේ, බන්ඩා හා ස්ලෝටර්, කවිපයේ දේශපාලන සන්ධානයන් හා කටයුතු මත ජාත්‍යන්තර සීමාවන් පැනවීම නොපිලිගන්නා බව ය. 1985 දෙසැම්බර් 11 වන දින ව'කර්ස් ලීගයේ දේශපාලන කමිටුව කවිප මධ්‍යම කාරක සභාව වෙත මෙසේ ලිවූහ: □

පසුගිය තෙමසක කාලය තුල ව'කර්ස් ලීගය යලි යලිත් කියා සිටියේ, කම්කරු විප්ලවවාදී පක්ෂය ඇතුලත දේශපාලන අර්බුදය ජයගත හැක්කේ බ්‍රිතාන්‍ය ශාඛාව එහි ජාත්‍යන්තර සහෝදරවරුන් සමඟ සමීපතම සහයෝගිතාවයකින් කටයුතු කරන්නේ නම් පමනක් බවයි. අවාසනාවකට මෙන් වසර ගනනාවක් තිස්සේ හීලි යටතේ ලැබූ වැරදි අධ්‍යාපනයේ ප්‍රතිපල වශයෙන්, කවිප නායකත්වය තුල බොහෝ සහෝදරවරුන් ජාත්‍යන්තර කමිටුව දැකගත්තේ නුරුස්නා ස්වභාවයකිනි. අව්‍යාජ සහයෝගිතාවය සඳහා ජාත්‍යන්තර කමිටුවේ ඉල්ලීම් ද එහි උපදෙස් ද සලකන ලද්දේ බ්‍රිතාන්‍ය ශාඛාවේ ජීවිතයට කෙරෙන අනවශ්‍ය ඇඟිලි ගැසීමක් ලෙසය. 'ජාත්‍යන්තර කමිටුවට කවිපයේ යටත්වීම' ගැන කල සඳහන කෙරෙහි සමහර සහෝදරවරුන් වෙතින් පලවූයේ සතුරු ප්‍රතිචාරයකි. සත්තකින්ම අප පොරබදන්නේ තනි තනි සාමාජිකයාගේ ආත්මීය දුබලකම් සමඟ නො වේ. කවිපය තුල බලගතු ජාතිකවාදී ප්‍රවනතාවන් පැවතීම, ලෝකයේ පැරනි ම අධිරාජ්‍යවාදී රටෙහි කම්කරු පන්තියේ ඓතිහාසික වර්ධනයේ දේශපාලන පිලිබිඹුවකි. ඒවා හඳුනාගෙන එම ප්‍රවනතාවන්ට එරෙහිව සටන් වදිනතාක් දුරට ඒවා ජයගත හැකිය. එම අරගලය ගෙනයාමේ වගකීම පැවරෙන්නේ කවිප නායකත්වයටයි. □

දැන් අප මුහුන දෙන බරපතල අන්තරාය නම් නායකත්වය විසින් දිරිගන්වනු ලබන ප්‍රති-ජාත්‍යන්තරවාදයයි. කම්කරු විප්ලවවාදී පක්ෂයේ ජාතික ස්වාධීනත්වය, සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂයෙහි ප්‍රමුඛ අංගය වන ජාත්‍යන්තර කමිටුවට එරෙහිව හරස් කරනු ලබයි. [111]

191. "හරියටම ජාත්‍යන්තරවාදයේ අඩංගු වන්නේ පන්ති රේඛා ඇඳ ගැනීමත් ඒවාට විරුද්ධව සටන් වැදීමත්ය" යන ස්ලෝටර්ගේ අභ්‍යර්තනයට ප්‍රතිචාර වශයෙන් දේශපාලන කමිටුව ප්‍රශ්නය මෙසේ මතුකලේ ය. □

එහෙත් මෙම "පන්ති රේඛා" තීරනය කරන්නේ කවර ක්‍රියාවලියකින්ද? ඒ සඳහා හතරවන ජාත්‍යන්තරයක් තිබීම අවශ්‍ය ද?

ඔහුගේ මුලු ලිපියේ ම සුවිශේෂී අන්තර්ගතය ලෙස දිවයන ස්ලෝටර්ගේ නිර්වචනයෙන් යෝජනා කෙරෙන්නේ, තමන් විසින් ම පිහිටුවාගන්නා "පන්ති රේඛා හා ඒවා ඔස්සේ සටන් වැදීමෙන්" ඕනෑම ජාතික සංවිධානයකට ජාත්‍යන්තර මට්ටමට ලඟාවිය හැකි බවය.

වර්කර්ස් ලීගය ස්ලෝටර්ට මෙසේ මතක්කර දුන්නේය.

> මාක්ස්වාදී මූලධර්ම හා ක්‍රියාමාර්ගය පිලිබඳ සමකාලීන වර්ධනය ට්‍රොට්ස්කිවාදය ලෙස පිලිගන්නා පක්ෂ, හතරවන ජාත්‍යන්තරය තුල සංවිධානය වන අතර, ජාත්‍යන්තර කමිටුවේ අධිකාරය පිලිගනිති. ජාත්‍යන්තරවාදය පිලිබඳ යමෙකුගේ නිර්වචනයේ පදනම වන්නේ, ක්‍රියාමාර්ගය එහි සංවිධානාත්මක ප්‍රකාශනයෙන් වෙන් කිරීම වූ කල්හි ඔහු, සිය ක්‍රියාකාරී ජාතික ක්ෂේත්‍රය තුල වැඩ කිරීමේ නිදහස රැකගැනීම සඳහා හජාජාක තුල ගැබ්ව ඇති මාක්ස්වාදයේ අඛන්ඩතාවය ප්‍රතික්ෂේප කරන ට්‍රොට්ස්කිවාදයේ විරුද්ධවාදීන් වන සියලු ම සංශෝධනවාදීන්ගේ හා මාධ්‍යමිකයන්ගේ දෘෂ්ටි ආස්ථානය පිලිගනියි. [112]

192. 1985 දෙසැම්බර් 16 වන දින ජාත්‍යන්තර පරිපාලන කොමිසමේ වාර්තාව ජාත්‍යන්තර කමිටුවට ලැබුනි. කව්පය විසින් ගොඩනගාගෙන තිබුනු දේශපාලන හා මූල්‍ය සම්බන්ධතාවන් පිලිබඳව පරීක්ෂාකර බැලීම සඳහා ජාක විසින් එය පිහිටුවන ලදී. 1976 හා 1985 අතර කාලයේ මැද පෙරදිග විවිධ ජාතික ධනේශ්වර තන්ත්‍රයන් සමඟ ජාත්‍යන්තර කමිටුවට නොදන්වා එම සම්බන්ධතා ගොඩනගාගෙන තිබුනි. කව්ප හතරවන ජාත්‍යන්තරයේ මූලධර්ම පාවාදුන් දේශපාලන සම්බන්ධතාවන්ට එලඹුනු බව අවසාන වශයෙන් තහවුරු කලේය. ස්ලෝටර් හා බන්ඩාගේ කන්ඩායම් නියෝජනය කරමින් පැමින සිටි කව්ප නියෝජිතයන්, ජාත්‍යන්තර සංවිධානයේ කව්ප සාමාජිකත්වය අත්හිටුවීමේ තීන්දුවට පලකල විරෝධය හමුවේ ජාත්‍යන්තර කමිටුව එයට පක්ෂව ඡන්දය දුන්හ. ජාත්‍යන්තර කමිටුව සමඟ දේශපාලන එකඟත්වයක් ඇතිව සිටි, කව්ප සාමාජිකත්වයේ සැලකිය යුතු කොටසක් නියෝජනය කල ඩේවිඩ් හයිලන්ඩ්, යෝජනාවට සහාය පලකලේ ය.

193. කව්ප තහනම නියෝජනය කලේ හතරවන ජාත්‍යන්තරය තුල විප්ලවකාරී ජාත්‍යන්තරවාදයේ මූලධර්ම පිලිබඳව යෙදූ අශමනීය අවධාරනයයි. මෙම ක්‍රියාවත් සමඟ හජාජාක, කිසිදු ආකාරයක ජාතික අවස්ථාවාදයක් විසින් ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී මූලධර්ම පාවාදීම නොඉවසන බව පැහැදිලිව තහවුරු කලේ ය. තහනමේ අරමුන කව්පයට දඬුවම් පැමිනවීම නොව, ජාක සාමාජිකත්වය සඳහා කොන්දේසි පෙලක් පිහිටුවා ලීමයි. 1985 දෙසැම්බර් 17 වන දින සම්මත කල දෙවන යෝජනාව, ජාක පදනම් වන ඓතිහාසික හා ක්‍රියාමාර්ගික අත්තිවාරම සැලකිල්ලට ගත්තේ ය. මෙම මූලධර්ම යලි තහවුරු කරන ලෙස එය කව්පයට කියා සිටි අතර, එසේ කරන ගමන්, ජාකට ඉක්මනින්ම යලි ඇතුල්වීම සඳහා සූදානම්වන ලෙස ද දැනුම් දුන්නේ ය. ප්‍රකාශනය මෙසේ නිමා විය.

> හීලි යටතේ කව්පයේ ඇතිවූ ජාතිකවාදී පරිහානියේ උරුමය බවට පත්ව ඇති පවත්නා ගැටලු හැකිතාක් ඉක්මනින් ජයගැනීම සඳහා දැන් කව්පයේ මධ්‍යම කාරක සභාව හා හජාජාක සමීප එකමුතුවකින් වැඩ කල යුතුය. කව්පය තුල ජාත්‍යන්තරවාදයේ ප්‍රධාන මූලධර්ම තහවුරු කිරීමට හා එම පදනමෙහි හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව තුල එහි සමස්ත සාමාජිකත්වය පිහිටුවා ගැනීමටත් කටයුතු කල යුතුය. මෙම සම්බන්ධතාවයේ සංවිධානාත්මක ව්‍යුහය සෑම විට ම හතරවන ජාත්‍යන්තරයේ ව්‍යවස්ථාවලියෙහි විස්ථාරනය කර ඇති, ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය පිලිබඳ ලෙනින්වාදී මූලධර්ම මත පදනම් වනු ඇත. [113]

194. යලිදු වතාවක් ඩේවිඩ් හයිලන්ඩ් හැර, අනෙකුත් කව්ප නියෝජියන් යෝජනාවට විරුද්ධව ඡන්දය දුන්හ. ඔවුන්ගේ ඡන්දයෙන් පැහැදිලි වූයේ කව්පය, ජාත්‍යන්තර කමිටුවේ දේශපාලන අධිකාරය හෝ ක්‍රියාමාර්ගය හෝ පිලි නොගන්නා බවයි. මසකට පසුව, කව්ප මධ්‍යම කමිටුව, බ්‍රිතාන්‍ය ශාඛාවේ සාමාජිකත්වය ජාත්‍යන්තර කමිටුවේ අධිකාරය පිලිගැනීම අවශ්‍යයයි 1985 ඔක්තෝබරයේ ඇති කර ගත් මුල් එකඟතාවය නිෂ්ප්‍රභා කිරීමට ඡන්දය දුන්හ. හයිලන්ඩ් හා කව්ප මධ්‍යම කාරක සභාවේ තවත් සාමාජිකයන් දෙදෙනෙක් එම ක්‍රියාවට විරුද්ධවූහ. කව්ප මධ්‍යම කාරක සභාවේ ඡන්දය සලකුනු කලේ ජාත්‍යන්තර කමිටුවෙන් භේදවීමේ තීරනය යි. 1986 පෙබරවාරියේ දී ජාත්‍යන්තර කමිටුවේ ආධාරකරුවන් සියල්ලන් ම ඉවත තැබූ නින්දිත සමුලුවක් කව්පය විසින් පැවැත්වී ය. මෙම දේශපාලන අවඥාව සලකුනු කලේ ට්‍රොට්ස්කිවාදී සංවිධානයක් ලෙස කව්පයේ නිශ්චිත අවසානය යි. ප්‍රතිට්‍රොට්ස්කිවාදී කර්කශ ප්‍රහාරයක් වූ, සමුලුව සඳහා සූදානම් කල ප්‍රධාන ලියවිල්ල "මෙතැන් පටන් ජාත්‍යන්තර කමිටුව වලලා

දමා, හතරවන ජාත්‍යන්තරය ගොඩනැංවීම වෙනුවෙන් හේතු 27ක්" යන මාතෘකාව යටතේ බන්ඩා විසින් පිලියෙල කලේය. මෙම ලියවිල්ල රචනා කිරීමෙන් මාස කිහිපයක් තුල බන්ඩා, හතරවන ජාත්‍යන්තරය සමඟ 40 වසරකට ආසන්න කාලයක් පැවති සිය සම්බන්ධය හෙලාදකිමින්, ස්ටැලින් කෙරෙහි ඔහුගේ මනාපය පලකලේය. කව්පය සම්බන්ධයෙන් ගත්විට, එහි විවිධ කන්ඩායම් එකක් පිටුපස එකක් බැගින් කඩාකප්පල් විය. දශකයකට මඳක් අඩු කාලයක් තුල, ස්ලෝටර් හා කව්පයේ හිටපු අනෙකුත් නායකයන්, බොස්නියාවේ එක්සත් ජනපද-නේටෝ ක්‍රියාන්විතයට දැඩි ලෙස බැඳී ගත්හ. බ්‍රිතාන්‍ය සංවිධානයේ එකම ශක්‍ය දේශපාලන ප්‍රවාහය වූයේ, කව්ප අර්බුදයෙන් හා බිඳවැටීමෙන් හිස එසවූ, ඩේව් හයිලන්ඩ් නායකත්වය දුන් ප්‍රවනතාවයි. එය ජාත්‍යන්තර කමිටුවේ මූලධර්ම පිලිගත්තේ ය. 1986 පෙබරවාරියේ දී මෙම ප්‍රවනතාවය, හජාජාක හි බ්‍රිතාන්‍ය ශාඛාව ලෙස අද දින සමාජවාදී සමානතා පක්ෂයේ පූර්වගාමියා වූ ජාත්‍යන්තර කොමියුනිස්ට් පක්ෂය ගොඩනැගීය. □

## හජාජාක භේදයේ හේතු හා වැදගත්කම පිලිබඳ තවත් ප්‍රකාශ

195. 1953 දී මෙන්ම, 1982-86 අතර කාලයේ ජාත්‍යන්තර කමිටුව තුල වැඩීගිය භේදය තුලදී ද, දෙවන ලෝක සංග්‍රාමයේ අවසානයෙන් පසුව සිව් දශකයක් පුරා පැතිර පැවතුනු ලෝක දේශපාලන ව්‍යුහය, දෙදරවා හරින දැවැන්ත වෙනස්කම්, 1980 ගනන් දෙවන භාගයේ දී අපේක්ෂා කරනු ලැබිනි. කව්පයේ දිග් ගැස්සුනු අර්බුදය වනාහි සංකීර්න හා ප්‍රතිවිරෝධී ක්‍රියාවලියකි. එහි මූලික හේතුව වැටී තිබුනේ ඒ හෝ මේ පුද්ගලයාගේ දුබලකම තුල නොව, ලෝක පරිමාන පන්ති බලවේගයන්ගේ සම්බන්ධතාවන් ඇතුලත සිදුවූ වෙනස්කම් තුලය. කම්කරු පන්තියේ වර්ධනය සම්බන්ධයෙන් දශක ගනනාවක් තිස්සේ ඉමහත් සාධනීය ක්‍රියා කලාපයක් ඉටුකල දේශපාලන පක්ෂයක් මේ තත්වයට ඇද වැටීම අසාමාන්‍ය දෙයක් නොවේ. ඉන් පසුව එලඹි කාලයේ නව කොන්දේසි මතුවීමත් නව කර්තව්‍යයන් මුන ගැසීමත් සමඟ එය අර්බුදයට ගියේ ය. මෙම ඓතිහාසික සංසිද්ධියේ වඩාත් ඛේදනීය නිදසුන් වන්නේ ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය හා බොල්ශෙවික් පක්ෂය යි. එහෙත් ඔවුන්ගේ අවසාන ඉරනම මඟින් ඔවුන් ලද ජයග්‍රහන මකාදැම්මේ නැත. □

196. එස්එල්එල් - කව්ප හා එහි ප්‍රමුඛ නායකයාවූ ජෙරී හීලි අත් කර ගත් දේ ද, සංවිධානයේ පසුකාලීන පරිහානිය මඟින් අවලංගු නොකලේ ය. එස්එල්එල් හා කව්ප ඉතිහාසය පිලිබඳ වෛෂයික අගැයීමක් මත අවධාරනය තබමින්, මැක්ස් ෂැට්මන්ගේ මරනින් පසුව, 1972 දෙසැම්බරයේ දී හීලි වුල්ෆර්ත්ට දුන් උපදෙසක් සිහියට නගාගැනීම වටනේ ය. ෂැට්මන් ගැන මරන වාර්තාවක් ලිවූ වුල්ෆර්ත්, සිය ජීවිතයේ අවසන් දශකයන්හි, කම්කරු පන්තිය හා සමාජවාදය පාවාදුන් මියගිය අය සුදුසු පරිදි ම හෙලාදුටුවේ ය. එහෙත් වුල්ෆර්ත් සිය හෙලාදැකීමට මෙය ද ඇතුල් කලේය, "ෂැට්මන් මියගියේ, ඔහුගේ ම පන්තියට ද්‍රෝහීවූවෙක් හා ප්‍රති-විප්ලවවාදියෙක් ලෙස ය. කෙටියෙන් කිවහොත් එය එසේය." වුල්ෆර්ත්ට පිලිතුරු දෙමින් හීලි මෙසේ සඳහන් කලේය. "මේ වැකිය ඒ හැටියට ගත්විට, එකවිට ම පෙනී යන්නේ පරස්වාචකව ය. මක් නිසාද යත් ෂැට්මන් නිකම්ම මැරුනා නො වේ, ඔහු ජීවත් ද වන්නේ ය. අවසනදී නින්දිත ලෙස පාවාදුන් අයෙකු පිලිබඳ මතකය, ස්වාභාවිකව ම ලබැඳි සිතුවිලි පහල කරන්නේ නැත. කෙසේ වෙතත් අප මෙහි සිටින්නේ වගකීම් පැවරීමට නොව තේරුම් ගැනීමටය." [114]

197. වසර බොහෝ ගනනක්, විශේෂයෙන් ම එස්ඩබ්ලිව්පීය 1963 දී යලි පැබ්ලෝවාදය කරා යාමෙන් පසුව, හතරවන ජාත්‍යන්තරයේ ක්‍රියාමාර්ගය හා උරුමය ආරක්ෂා කිරීමේ දී බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදීහු බොහෝකොට ම හුදෙකලාව පසුවූහ. ඕසීඅයි එන්ට එන්ටම අවිශ්වාස දායක සගයෙක් ලෙසත්, 1960 ගනන් අවසන් වසරවල දේශපාලන විරුද්ධවාදියෙකු ලෙසත් මතුවන තතු හමුවේ එස්එල්එල්. හතරවන ජාත්‍යන්තරය, ස්ටැලින්වාදය, ධනේශ්වර ජාතිකවාදය හා සුලු ධනපති රැඩිකල්වාදයේ සෙවන තුල දියකරහැරීමේ පැබ්ලෝවාදී උත්සාහයට අශමනීයව විරෝධය පෑහ. මන්දගාමී ජාත්‍යන්තර සහයෝගය හමුවේ එස්එල්එල්, සිය උපරිම ශක්තියෙන්, බ්‍රිතාන්‍ය තුල බලගතු විප්ලවවාදී සංවිධානයක් ගොඩනැගීම මඟින් පැබ්ලෝවාදී දියකරහැරීම්වාදයට විරුද්ධ වීමට උත්සාහ කලහ. හීලි මෙම ව්‍යාපෘතිය තුලට, විප්ලවවාදී සංවිධායකයෙක් හා කථිකයෙක් ලෙස සිය අත්‍යසාමාන්‍ය ප්‍රතිපදානයන් ඇතුල් කලේය. ට්‍රොට්ස්කිවාදයට ස්වාධීන දේශපාලන ක්‍රියාවලියක් ඉටුකිරීමට අවකාශ නැතැයි පැබ්ලෝවාදීන් අවධාරනය කරද්දී එස්එල්එල්, බ්‍රිතාන්‍ය ලේබර් පක්ෂයට එරෙහිව වෙහෙස නොබලා ගෙනගිය යුද ගැටුමක නියැලී සිටි අතර, එහි තරුන සංවිධානය වන තරුන සමාජවාදියෝහි දේශපාලන නායකත්වය අල්ලා ගත්තේ ය. බ්‍රිතාන්‍ය ලේබර්වාදීහු, තරුන සමාජවාදීන්ගේ කීප් ලෙෆ්ට් (වමෙන් යනු) යන පුවත්පත තහනම් කිරීම මඟින් මෙම ප්‍රහාරයට මුහුනපෑමට උත්සාහකල විට, එස්එල්එල් හා තරුන සමාජවාදයෝහි සිය ආධාරකරුවන්, පෙරලා සටන් වදිමින් එහි පාඨක සංඛ්‍යාව 10,000ක් දක්වා ඉහල නැංවූහ. අවසනදී, තරුන සමාජවාදයෝ නිල

වශයෙන්ම බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ තරුන අංශය බවට පත්විය. පැබ්ලෝවාදීන් එස්ඩබ්ල්ආර් හි ජයග්‍රහනවලට ප්‍රතිචාර දැක්වූයේ, එස්ඩබ්ල්ආර් "ප්‍රචන්ඩ" සංවිධානයක් ලෙස හංවඩු ගැසීමට උත්සාහ කල ස්ටැලින්වාදීන් විසින් උද්යෝගීමත්ව දුන් පිටුබලය සහිතව කුරිරු දේශපාලන දඩයමක් සංවිධානය කරමිනි. 

198. දේශපාලන හුදෙකලාවේ, දී ඇති කොන්දේසි තුල එස්ඩබ්ල්ආර් සංවිධානය, හතරවන ජාත්‍යන්තරයේ වර්ධනය දැකගැනීමට පටන් ගත්තේ, එංගලන්තය තුල සිය සංවිධානයේ වර්ධනයෙහි අතුරු ඵලයක් ලෙස ය. එංගලන්ත ව්‍යාපාරය ලබන ජයග්‍රහන, ජාත්‍යන්තර කමිටුවේ වර්ධනය සඳහා පදනම දමනු ඇතැයි යන්නට, එමඟින් හේතු සම්පාදනය කෙරුනි. එබැවින්, කල් ගතවන විට, වැඩ ක්‍රමයේ ආකෘතීන් හා හුරු පුරුදු එන්ට එන්ට ම ජාතිකවාදී පැහැයක් ගත්තේ ය. ජාත්‍යන්තර කමිටුව තුල ඉමහත් බරක් දැරූ බ්‍රිතාන්‍ය වැඩ කටයුතු කෙරෙහි වූ නැඹුරුව, නිසැකව ම දේශපාලන බලවේගයන්ගේ තාවකාලික සම්බන්ධතාවක් වූ නමුත් එය, හතරවන ජාත්‍යන්තරය හා එස්ඩබ්ල්ආර්-කව්පය අතර බැඳීම, එන්ට එන්ට ම ජාතිකවාදී වූ සංකල්පයක් කරා ඔසවා තැබීය. 1970 ගනන්වල සිට 1980 ගනන් දක්වා කව්පය විසින් වර්ධනය කල විවිධ වර්ගයේ අවස්ථාවාදී සම්බන්ධතා හා භාවිතාවන්, හීලි විසින්, අඩු ගනනේ ඔහුට ම යුක්තිසහගත කරගත්තේ, එංගලන්තය තුල "පක්ෂය ගොඩනගනවාය" යන පදනම මත ය. එමඟින් ඔහු දිගු කාලයේ දී, ජාක ලෝක පරිමානව ප්‍රසාරනය කිරීමේ පදනම දමන බවද කීවේ ය. ජාත්‍යන්තර කමිටුවේ විවිධ කොටස්වල, සැලකිය යුතු දේශපාලන වර්ධනයක් 1970 ගනන් හා 1980 ගනන් මුල අත්දකිනු ලැබුවත්, කව්පය ජාත්‍යන්තර සංවිධානයට සැලකීමට පටන් ගත්තේ බ්‍රිතාන්‍ය පදනම් කරගත් සංවිධානයේ ශාඛාවක් ලෙසට ය.

199. මෙම ප්‍රවිෂ්ටයේ නොවැලැක්විය හැකි ගැටලුව වූයේ එය, හතරවන ජාත්‍යන්තරයේ දේශපාලන සම්ප්‍රදායන්ට පටහැනිව යාම මෙන්ම ගෝලීය සමාජ-ආර්ථික හා දේශපාලන වර්ධනයේ වෛෂයික ක්‍රියාවලීන් සමඟ ද ගැටීමයි. කව්පයේ අර්බුදය වනාහි, කම්කරු පන්තිය මත ඓතිහාසිකව පදනම් වූ සියලු ම මහජන පක්ෂ හා වෘත්තීය සමිති සංවිධාන පිසගෙන ගමන් කල පුලුල් ක්‍රියාවලියක කොටසක් විය. දේශපාලන බැඳීම් හා සංවිධානාත්මක ව්‍යුහයේ දී ඔවුන් අතර කුමන වෙනස්කම් තිබුන ද, ස්ටැලින්වාදී, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා සංශෝධනවාදී සංවිධාන පදනම් වූයේ ජාතිකවාදී ක්‍රියාමාර්ගයක් මතය. මෙම අත්‍යාවශ්‍ය සාම්‍යය, සමහන් කල නොහැකි සතුරන් ලෙස මතුපිටින් පෙනෙන්නට තිබුනු ඇමරිකානු ඒඑෆ්එල්-සීඅයිඕ සංවිධාන හා සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය පවා එකට බැඳ දැමීය. පසුව කී එකේ ක්‍රියාමාර්ගය, සෝසසසං නිෂ්පාදන බලවේගයන්හි සමාජවාදී ශක්‍යතාව මත පදනම්වූ අතර පලමුව කී එකේ ප්‍රතිසංස්කරනවාදී අභිලාෂයන්, ඇමරිකානු ධනවාදයේ නොසිඳෙන්නේය යි සලකනු ලැබූ සම්පත් හා ධනය මත පදනම් විය. තාක්ෂනයේ වර්ධනයත්, එහි ප්‍රතිපල වශයෙන් නිෂ්පාදනයේ හා පශ්චාත් දෙවන ලෝක යුද සමයේ ජාතික ප්‍රතිසංස්කරනවාදී ඉදිරිදර්ශනයන්ට මඟ සැලසූ ප්‍රාග්ධන සංචලනයත් සමඟ අභාවයට පත්වූ අතර, ඉහත කී සංවිධාන දෙක ම අර්බුදයකට ඇද වැටුනි.

200. ලෝක ආර්ථිකයේ ඇතිවූ මෙම අතිමූලික වෙනස්කම් හා ජාත්‍යන්තර පන්ති අරගලය කෙරෙහි ඒවායේ බලපෑම, ජාත්‍යන්තර කමිටුව තුල පිලිබිඹුවූයේ, අවසාන විග්‍රහයේ දී භේදයට මඟපාදමින් ය. එක් අතකින් විප්ලවවාදී ජාත්‍යන්තරවාදයත් අනෙක් අතින් ජාතික අවස්ථාවාදයත් අතර, දේශපාලන ඉදිරිදර්ශනයේ මූලික වෙනස, සංවිධානාත්මක භේදයට පෙරාතුව, පැහැදිලි ලෙස ඉස්මතු විය. ව'කර්ස් ලීගය වෙනුවෙන් නෝර්ත්, 1984 ජනවාරි 23 දරන ලිපියෙන් මයිකල් බන්ඩා වෙත මෙසේ ලිවීය. "විවිධ වෘත්තීය සමිති අරගල තුල අපගේ ම අත්දැකීම් වැනි, ශාඛාවන්හි ජාතික වැඩ කටයුතුවල සමහර වර්ධනයන් කොතෙක් බලාපොරොත්තු සහගත යයි පෙනී ගිය ද, ඒවා විද්‍යාත්මකව ගොඩනගන ලද ඉදිරිදර්ශනයකින් නොමෙහෙය වන තාක් දුරට අදාල ශාඛාවන් සඳහා සැබෑ ජයග්‍රහන ගෙන නොඑනු ඇත. ව'කර්ස් ලීගය වඩ වඩාත් කම්කරු පන්තිය වෙත හැරෙන කල අපට වඩාත් දැනෙන්නේ එම කටයුතු පෙරට ගෙනයාම සඳහා ජාත්‍යන්තර සහෝදරවරුන්ගේ සහභාගිත්වයේ අවශ්‍යතාවයි." [115]

201. කව්පයේ ජාතික අවස්ථාවාදය කෙරෙහි ව'කර්ස් ලීගයේ විරුද්ධත්වය, දැනටමත් සංවර්ධනයේ වැඩි දියුනු අවස්ථාවක හා ලෝක දේශපාලන සම්බන්ධතාවන්හි පවත්නා ව්‍යුහයන් කැබලිවලට පුපුරවා හැරීමට තර්ජනය කරන සමාජ හා ආර්ථික ක්‍රියාවලීන් සමඟ න්‍යායිකව සන්ධානගතව පැවතුනි. 1960 ගනන් හා 1970 ගනන්වල හජාජාක වෙත ඇදී ආ ජාත්‍යන්තර කේඩරයෙන් විශාල කොටසක් එසේ ඇදී ආවේ නොනවතින විප්ලවයේ ජාත්‍යන්තර ඉදිරිදර්ශනය ආරක්ෂා කිරීමේ ලා බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදීන්ගේ අරගලය මත වූ තාක් දුරට, ව'කර්ස් ලීගය ඉදිරිපත්කල විවේචන ජාත්‍යන්තර කමිටුව තුල පුලුල්ව හඳුනාගැනීමත් සමඟ ඉමහත් සහයෝගයක් ගොනුකර ගත්තේ ය. 1985 ශරත් සමයේ ජාත්‍යන්තර කමිටුව තුල ඇති වූ සාපේක්ෂව වේගවත් දේශපාලන ප්‍රතිසන්ධානයට මුල්වූයේ මෙයයි. එය ජාත්‍යන්තර ව්‍යාපාරයේ වැඩ කටයුතු සඳහා නව පදනමක් පිහිටුවීය. ඉන් පසු කාලයේ හජාජාක වර්ධනය වනාහි, නව ආර්ථික හා දේශපාලන තත්වය කෙරේ මාක්ස්වාදී පෙරටු බලඇනියේ සවිඥානක ප්‍රතිචාරයයි. ව්‍යාපාරය

යලි දිශානගතවීම පදනම් වුයේ සියලු වර්ගවල ජාතිකවාදයට එරෙහි ක්‍රමානුකූල අරගලයක් මතය. යලි දිශානගතවීම නොවැලැක්විය හැකි ලෙස ජාත්‍යන්තර ඉදිරිදර්ශනයක් වර්ධනය කිරීම සමඟ බැඳී තිබුනි. සියලු අවස්ථාවාදයන් අවසානයේ දී මුල් ඇදගත්තේ ජාතිකව අනුගතවීමේ නිශ්චිත රූපාකාරයක් තුල ය. තමන්ගේ ම සංවිධානය තුලත් ඉන් පිටතත්, අනෙකුත් ප්‍රවනතාවන්ට එරෙහි අරගලයේ දී හජාජාක යලි යලිත් අවධාරනය කලේ, ට්‍රොට්ස්කි විසින් ඒවායේ ඉහල ම රූපයෙන් වර්ධනය කල සංකල්ප එනම්, ඕනෑම දී ඇති ජාතික රාජ්‍යයක් තුල විශේෂයෙන් ප්‍රකාශයට පත්වන ලෝක ආර්ථිකයෙහි ගෝලීය වර්ධනයේ ප්‍රාථමිකත්වය හා ජාතික ක්‍රමෝපායන් මත ජාත්‍යන්තර මූලෝපායේ ප්‍රාථමිකත්වය යි.

## මතු සම්බන්ධයි

## සටහන්

[104] *Leon Trotsky and the Development of Marxism,* ඩේවිඩ් නෝර්ත්: ලියොන් ට්‍රොට්ස්කි සහ මාක්ස්වාදයේ සංවර්ධනය (ඩෙට්‍රොයිට්, 1985) පි. 5; 17-19.

[105] *Fourth International*, හතරවන ජාත්‍යන්තරය (ඩෙට්‍රොයිට්, 1986) වෙලුම 13, ශරත් කලාපය, අංක 2, 1986, පි.16-18.

[106] එම, පි. 23.

[107] එම, පි. 35.

[108] එම, පි. 39.

[109] එම, පි. 42-3.

[110] *Fourth International*, හතරවන ජාත්‍යන්තරය (ඩෙට්‍රොයිට්, 1986) වෙලුම 13, ශරත් කලාපය, අංක 2, 1986, පි. 52.

[111] එම, 77 පිටුව.

[112] එම.

[113] එම, පි. 102.

[114] *Trotskyism versus Revisionism*, 'හතරවන ජාත්‍යන්තරය සහ වුල්ෆර්ත් ද්‍රෝහියා', සංශෝධනවාදයට එරෙහිව ට්‍රොට්ස්කිවාදය වෙලුම 7 (ඩෙට්‍රොයිට්, ලේබර් ප්‍රකාශන, 1984), පි. 228.

[115] *Fourth International,* හතරවන ජාත්‍යන්තරය, 13 වන වෙලුම, නො. 2. 1986 ශරත් කලාපය, 38 වන පිටුව.

© www.wsws.org